# ක්‍රියාකාරකම් පත්‍රිකාව



- අසමු රස විඳිමු.



පිං සිඳුවෙන්නේ අනේ බාල ළමුන්නේ
මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටනි දවස පුරා කූඩු තනාලා
පිං සිඳුවෙන්නේ......

කොලේ කොලේ දමා කුඩා නිවස සදන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ එය නොකඩන්නේ
පිං සිඳුවෙන්නේ......

දෙමාපියන් සෙනේ වෙතේ තම දරුවන්ටා
ළමා ඔබෙන් අපට නැතේ මිහිපිට ඉන්ටා
සමාවෙලා මෙඅප වෙතේ දිවි රැක ගන්ටා
නමා යදිමි දෙන්න පුතේ මෙතන රැඳෙන්ටා
පිං සිඳුවෙන්නේ......//

ගායනය - සී.ටී. ප්‍රනාන්දු
පද රචනය - ආර්.එන්.එච්. පෙරේරා

The National e-learning Portal for the General Education